# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.18 පැය 1450 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1862/2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.12.17 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේ කොටිකකාවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 150 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වූ කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලේ කඳවුර.**

2024.12.17 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හපුතලේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් දියතලාව පොලිස් වසමේ අලුත්වෙල ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන දියතලාව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වූ බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

දියතලාව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර පටවමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුර.**

2024.12.17 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අරලගංවිල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් අරලගංවිල පොලිස් වසමේ මාදුරු ඔය ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කර පටවමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අරලගංවිල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ අරලගංවිල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

අරලගංවිල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුර

2024.12.17 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා වාකරේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වාකරේ පොලිස් වසමේ සීනිලාවලි ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වාකරේ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වූ කදිරවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

වාකරේ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**